# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

මොහොමඩ් රමීස් ෆාතිමා නස්රා
28 A,
රේවත පාර,
බලපිටිය

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය : 1021/2021**

**එදිරිව**

පාරිභෝගික කටයුතු පිළිබඳ
අධිකාරිය
1, 2 මහල,
සතොස මහලේකම් කායර්ාල
ගොඩනැගිල්ල,
27 වොක්ෂෝල් වීදිය
කොළඹ 02

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවධර්න - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක නැත.
පොදු අධිකාරිය නැත.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - 2022.01.13

**විභාග කළ දිනය** : 2022.05.26

**තීරණය කළ දිනය** : 2022.05.26

**<u>තීරණය :</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2021.09.05 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

1. *"2021 වෂර්යේ ආනයනය සිදුකරනු ලබන පාම් ඔයිල් හා පොල්තෙල් වල පිළිකා කාරක හා වස විස අඩංගු වේද?*

2. *ආනයනය කරනු ලබන පාම් ඔයිල් ලීටරයක වත්මන් මිල කොපමණද?*
3. *රජය විසින් ආනයනය කරනු ලබන පාම් ඔයිල් ලීටරයක් සඳහා අයකරනු ලබන බදු මුදල කොපමණද?"*

තොරතුරු නිලධාරියා විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2021.09.20 දිනැතිව නම්කළ නිළධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිළධාරියා විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2021.10.23 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

අභියාචකගේ 2021.09.05 දිනැති තොරතුරු ඉල්ලීමට සහ 2021.09.20 දිනැති අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 24 (3) සහ 25 (1) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා හටද, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරියා හට ද පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ තොරතුරු නිළධාරියා සහ නම්කළ නිළධාරියා විසින් පැහැර හැර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

පොදු අධිකාරිය විසින් 2022.01.13 දිනැතිව කොමිෂන් සභාව වෙත ලිඛිත කරුණුදැක්වීමක් සිදු කරමින් පහත පරිදි කරුණු දක්වා ඇත.

> *"............අප අධිකාරිය වෙතින් ඉල්ලා ඇති තොරතුරු 2021.12.14 දිනැතිව ඇය වෙත ලබාදී ඇති අතර, ඊට අදාළ ලිපිය මේ සමඟ අමුණා එවමි. (ඇමුණුම 1)"*

**සළකා බැලීම**

අභියාචක හට අදාළ තොරතුරු ලබා දුන් බවට පොදු අධිකාරිය විසින් සඳහන් කරමින් 2022.01.13 දිනැති ලිපියක් කොමිෂන් සභාව වෙත එවා ඇත. ඒ අනුව මෙම අභියාචනය අවසන් කිරීමට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිළධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.